# 1

# අප ඔක්තෝබර් විප්ලවය හැදෑරිය යුතු ය.

## 1924

අපි ඔක්තෝම්බර් විප්ලවයේ දී ජයග්‍රහනය කලෙමු. එහෙත් ඔක්තෝම්බර් විප්ලවය අපගේ පොත පත තුළ ලබා ගත්තේ සුලු ජයග්‍රහණයක් පමණි. ඔක්තෝම්බරයේ සිදු වූ මහා පෙරලිය පිළිබඳ පූර්ණ චිත්‍රයකත් සපයන්නා වූ ද එහි වැදගත් ම දේශපාලන හා සංවිධානාත්මක අංග උචිත පරිදි අවධාරනය කරන්නා වූ ද එකම කෘතියක් වත් අප මේ වන තෙක් නිර්මාණය කර නැත. ඊටත් වඩා අයහපත් කරුණක් ඇත. එනම්, විප්ලවය සූදානම් කිරීමත් විප්ලවය මත් පිළිබඳ අතිශය වැදගත් ලිපි ලේඛන ඇතුලු විවිධ ඍජු මූලාශ්‍රයන් තවමත් ප්‍රසිද්ධ නොකර තිබීම ය. විප්ලවයේ ඔක්තෝම්බරයට පෙර ඉතිහාසය ද පක්ෂයේ ඔක්තෝම්බරයට පෙර ඉතිහාසය ද මෙන්ම ඔක්තෝම්බරයෙන් පසු සමය පිළිබඳව ද බොහෝ කරුණු හා ලිපි ලේඛණ අප විසින් ප්‍රසිද්ධ කොට ඇත. එහෙත් ඔක්තොම්බර් විප්ලවයට ම නම් ලැබී ඇත්තේ ඉතා අඩු අවධානයකි. හරියටම එක් වරක් විප්ලවය දිනූ අප යලිත් කවර කාලෙක වත් එබන්දක් කිරීමට සිදු නොවනු ඇතැයි තීන්දු කර ඇත්තාක් මෙනි. ඔක්තොම්බර් විප්ලවය ද එය සඳහා කෙලින් ම සැරසීමේ සැබෑ තතු ද එය සැබැවින් ම ජයග්‍රහණය කිරීම ද ඉක්බිති සති කිහිපය තුළ එය තහවුරු කිරීම ද යනාදිය හැදෑරීම, අප ඉදිරියේ ඇති කල් දැමිය නොහැකි, අනාගත ගොඩ නැගීමේ කර්තව්‍යයන්ට ඍජු හා ක්ෂණික ප්‍රතිලාභයක් ලබා නොදෙතැයි සිතුවාක් මෙනි.

මෙබඳු ප්‍රවිෂ්ටයක් සමහරවිට නොදනුවත් විය හැකි නමුත් ගැඹුරින් ම සාවද්‍යය, එමතතු ද නොව, පටුය. ජාතිකවාදීය, රුසියාවේ අපටම ඔක්තෝම්බර් විප්ලවයේ අත්දැකීම් තුළින් යලිත් ගමන් කිරීමට සිදු නොවීමට පුළුවන. එහෙත් අපට එම අත්දැකීමෙන් ඉගෙන ගැනීමට කිසිවක් නැතැයි එයින් කිසිසේත්ම ගම්‍ය වන්නේ නැත. අප ජාත්‍යන්තරයේ කොටසකි. අනෙකුත් සියලුම රටවල් කම්කරුවෝ තම තමන්ගේ "ඔක්තෝම්බරය" පිළිබඳ ගැටලුව විසඳීමේ අභියෝගයට මුහුණ පා සිටිති. බටහිර රටවල වඩාත්ම සංවර්ධිත කොමියුනිස්ට් පක්ෂ පවා අපේ ඔක්තෝබරයේ අත්දැකීම් උකහා ගැනීමට අසමත්ව සිටි අයුරු ද එපමණක් නොව අපේ ඔක්තෝම්බරයේ සැබෑ කරනු පිළිබඳව මුලුමනින් ම වාගේ නොදැනුවත්ව සිටි අයුරු ද පිලිබඳ සෑහෙන සාක්ෂ්‍ය පසුගිය අවුරුද්දේ අපට දැක ගන්ට ලැබුනි.

නිසැකවම, පැරනි මතභේද හාරා අවස්සන්නේ නැතිව ඔක්තොම්බරය හැදෑරීම හෝ ඔක්තෝම්බරය පිළිබඳ ලියවිලි පල කිරීම පවා හෝ කළ නොහැකි ය යන විරුද්ධතාව කෙනෙකුට මේ සම්බන්ධයෙන් මතු කළ හැකිය. එහෙත් ප්‍රශ්නය පිළිබඳ එබඳු ප්‍රවිෂ්ටයක් වනාහි සාකල්‍යයෙන් ම පටු වූ ආකල්පයකි. 1917 දී පැන නැගුනු මතභේද සැබැවින් ම අතිශය ප්‍රගාඪ විය. කිසි සේත්ම අහම්බ ද නොවීය. එම සිද්ධීන්, එකල නොමග ගිය අයට විරුද්ධව ප්‍රහාරයක අවි බවට හරවා ගැනීමට ඒවා සිදු වී අවුරුදු ගනනාවකට පසු දූන් යමෙක් උත්සාහ කරන්නේ නම් එතරම් තුච්ඡ තවත් දෙයක් තිබිය නොහැකිය. එහෙත් පටු පෞද්ගලික හේතු ඉදිරිපත් කරමින් සැබැවින් ම ජාත්‍යන්තර අර්ථ භාරයක්

දරන්නා වූ ඔක්තෝම්බර් විප්ලවයේ ඉතා වැදගත් ගැටලු පිළිබඳව මුනිවත රැකීම ඊට වඩා දෝෂ සහගතය.

අපි ගත වූ වසරේ බල්ගේරියාවේදී දරුණු පරාජයන් දෙකකට මුහුණ පෑවෙමු. ප්‍රථමයෙන් විප්ලවවාදී ක්‍රියාව සඳහා සුවිශේෂයෙන් ම වාසි සහිත වූ මොහොතක්, දෛවාදී හා පොතේගුරු වාදී කාරනා උඩ ලිස්සා හැරීමට පක්ෂය ඉඩ හැරියේය. (ඒ ට්සැන්කොව්ගේ ප්‍රති *රාජ්‍ය බල කොල්ලයෙන්* ඉක්බිත පැන නැගී ගොවිජන නැගිටීම අවස්ථාවේ දී ය.) මී ලඟට වරද පිරිමසා ගැනීමට ගිය පක්ෂය අවශ්‍ය දේශපාලන හෝ සංවිධානාත්මක සූදානමකින් තොරව සැප්තැම්බර් සන්නද්ධ නැගිටීමට පැන ගති. බල්ගේරියානු විප්ලවය ජර්මානු විප්ලවයේ පෙරවදන විය යුතුව තිබුණි. අවාසනාවකට මෙන් සදොස් බල්ගේරියානු පෙරවදන ජර්මනිය තුළ ඊටත් වඩා දෝෂ සහගත පසු වදනකට මග පෑදුවේය. ලෝක ඓතිහාසික වැදගත්කමක් දරන්නා වූ අන්‍යන්තයෙන් ම සුවිශේෂ විප්ලවවාදී තත්ත්වයක් මග හැර ගත හැක්කේ කෙසේද යන්න පිළිබඳ සම්භාව්‍ය උදාහරනයක් අපි පසු ගිය අවුරුද්දේ අගභාගයේ දී, ජර්මනියේ දී දුක ගතිමු. කෙසේ වෙතත් යලි වරක්, ඉහත සඳහන් පසු ගිය අවුරුද්දේ බල්ගේරියානු අත්දැකීම් හෝ ජර්මානු අත්දැකීම් ඇති තරම් සෑහෙන හෝ සංයුක්ත ඇගැයීමකට භාජනය වී නොමැත. මේ ලිපියේ කතෘ පසුගිය අවුරුද්දේ ජර්මානු අත්දැකීම පිළිබඳ පොදු දළ සටහනක් ලියුවේය. (නැගෙනහිර සහ බටහිර යන පොත්පිංචේ "සන්ධිස්ථානයේදී" සහ "අප ගමන් කරමින් සිටින්නේ කුමන අවධියකින් ද?" යන පරිච්චේද) ඉන් පසුව සිදු වූ සෑම දෙයක්ම මෙම දළ සටහන කොටස් වශයෙන් පමණක් නොව සමස්තයක් වශයෙන් ද සනාථ කර ඇත. අන් කවරෙක් වත් මේ පිළිබඳ වෙනත් අර්ථකථනයක් කිරීමට උත්සාහයක් හෝ දරා නැත. නමුත් දළ සටහනකට වැඩි දෙයක් අපට අවශ්‍යය. පසු ගිය අවුරුද්දේ ජර්මනියේ සිදුවීම් පිළිබඳ සත්‍ය දත්තයන්ගෙන් යුතු සංයුක්ත විස්තරයක් අපට නැතිවම බැරි ය. අපට අවශ්‍ය වන්නේ මෙම බෙහෙවින් ම කටුක ඓතිහාසික පරාජයේ හේතු පිළිබඳ සංයුක්ත පැහැදිලි කිරීමක් සහිත විස්තරයකි.

අප විසින් අද වන තෙක් ඔක්තෝබර් විප්ලවය දේශපාලනිකව හා උපායාත්මකව විග්‍රහ කෙරෙමින් ඉදිරිපත් කෙරෙන විස්තරයක් දී නැති තත්ත්වයක් තුළ බල්ගේරියාවේ හා ජර්මනියේ සිද්ධීන් විශ්ලේෂණය කිරීම ගැන කියනු ම කවරේ ද? ඔක්තෝම්බරයේ දී අප ඉටු කළේ කුමක්ද? එය ඉටු කළේ කෙසේද යන්න අපි කවරදාකවත් අපටම පැහැදිලි කරගෙන නැත. ඔක්තෝබරයෙන් පසුව, ජයග්‍රහනයේ උද්දාමය තුළ, යුරෝපයේ සිද්ධීන් ඉබේට ම වර්ධනය වන්නාක් මෙන් ද එම වර්ධනයේ උග්‍ර වේගය නිසා ඔක්තෝබරයේ පාඩම් න්‍යායිකව උකහා ගැනීමට අපට කාලයක් නැතිවාක් මෙන්ද පෙනී ගියේය. එහෙත් සිද්ධින් විසින් ඔප්පු කරනු ලැබුවේ කම්කරු පන්ති විප්ලවය මෙහෙයවීමට සමත් පක්ෂයකින් තොරව විප්ලවය කළ නොහැකි බව යි. ස්වයං සිද්ධ නැගිටීමක් මගින් කම්කරු පන්තියට බලය අල්ලා ගත නොහැකි ය. ඉහළින්ම කාර්මික වූත් සංස්කෘතිමත් වූත් ජර්මනියේ කම්කරුවන්ගේ ස්වයං සිද්ධ නැගිටීමෙන් 1918 නොවැම්බර් ඉටු වූයේ බලය ධනේෂ්වරය අතට මාරු කිරීම පමණි. එක් දේපොල හිමි පන්තියක් තවත් දේපෙල හිමි පන්තියකින් බලය උදුරා ගැනීමට සමත් වන්නේ අවශ්‍ය ධන සම්පත් ද

සංස්කෘතික මට්ටම් ද පැරනි රාජ්‍ය යන්ත්‍රය සමග අසංඛ්‍ය සබඳතා ද මත පදනම් වී ගැනීමට ඔවුන්ට හැකි වන නිසා ය. එහෙත් කම්කරු පන්තිය බලය අල්ලා ගැනීමේදී, තමන්ගේ ම පක්ෂය මිස, ඒ සඳහා යොදා ගත හැකි වෙනත් ආදේශකයක් නොමැත. කොමියුනිස්ට් පක්ෂ සර්වාංග වශයෙන් ගොඩ නැගීමේ වැඩ ("ජනතාව දිනා ගනු", "එක්සත් පෙරමුණ" යනාදී සටන් පාඨ යටතේ) ඇත්ත වශයෙන් ම ආරම්භ වූයේ 1921 මැද භාගය වන විට ය. ඔක්තෝබර් විප්ලවය ඉස්මතු කල ගැටලු සමගම ඔක්තෝබරය අධ්‍යයනය කිරීමත් පසුබිමට තල්ලු වී ගියේය. එහෙත් පසුගිය වසරේ දී අපි කම්කරු පංතික විප්ලවය පිළිබිඳ ගැටලුවලට යලිත් වරක් මුහන දී සිටියෙමු. මේ පිළිබඳ සියලු ලියිවිලි එක් රැස් කොට, ඇත ඇති සියලු ද්‍රව්‍ය මුද්‍රණය කොට ඒවා හැදෑරීමට යෙදී ගැනීමට කාලය එළඹ ඇත.

ඇත්ත වශයෙන් ම සෑම ජාතියක් ම සෑම පන්තියක්ම, පමණක් නොව සෑම පක්ෂයක් ම ද පවා, උගෙන ගන්නේ ප්‍රාථමිකව තමන්ගේ ම අත්දැකීමේ කටුක ප්‍රහාරයන්ගෙන් බව අපි සෑම දෙනාම හොඳින් දනිමු. එහෙත් පිටරටවල, වෙනත් පන්තිවල සහ පක්ෂවල අත්දැකීම සුලු වැදගත්කමක් පමණක් දරන බව කිසිසේත් ම මින් ඇඟවෙන්නේ නැත. මහා ප්‍රන්ස විප්ලවය, 1848 විප්ලවය හා පැරිස් කොමියුනය අධ්‍යයනය කිරීමේ ලා අප අසමත් වී තිබුනේ නම්, 1905 අත්දැකීම් තුළින් අප ගමන් කළේ වී නමුත්, ඔක්තෝබර් විප්ලවයේ ජයග්‍රහනය අත් කර ගැනීමට අප සමත් නොවන බව නිසැකය. එමතු ද නොව, අපගේ මෙම 'ජාතික' අත්දැකීම තුළින් අප ගමන් කලේ පැරණි විප්ලවයන්ගෙන් උකහා ගත් නිගමනයන් මත පදනම් වී ගිනිමින් ද ඒවායේ ඓතිහාසික රේඛාව දීර්ඝ කරමින් ද වේ. ඉක්බිති, විප්ලවයේ මුලු මහත් කාල පරිච්ඡේදය යොදා ගනු ලැබුවේ 1905 අවුරුද්දෙන් උගත යුතු පාඩම් ද උකහා ගත යුතු නිගමනයන් ද අධ්‍යයනය කිරීම සඳහාය. අනෙක් අතට, 1917 ජයග්‍රාහී විප්ලවය සම්බන්ධයෙන් එබඳු කටයුත්තක් ඉටු කර ගනු ලැබුයේ නැත. අඩු ගනනේ ඉන් දහයෙන් පංගුවක් වත් කරනු ලැබුවේ නැත. සත්තකින් ම අප දැන් ජීවත් වන්නේ ප්‍රතිගාමීත්වයේ වර්ෂයන් තුළ නොවේ. අප ඉන්නේ පිටුවාහලේ ද නොවේ. එහෙත් එම කටුක අවුරුදු වල අපට තිබුණු සම්පත් ද බලවේ ද අද අපට ඇති සම්පත් වලට හා බලවේගවලට කිසි සේත් ම සම වූයේ නැත. අප කළ යුතුව ඇත්තේ පක්ෂය තුල ද සමස්තයක් වශයෙන් ජාත්‍යන්තරය තුළ ද ඔක්තෝබර් විප්ලවය හැදෑරීම පිළිබඳ කර්තව්‍යය පැහැදිලිව හා සරලව ඉස්මතු කිරීමය. අතීතය පිළිබඳ උත්තම අනිභියෝගී හා අනිවර්තනීය පරීක්ෂණය වූ ද අනාගතය සඳහා දොරටු පුලුල්ව විවෘත කලා වූ ද ඔක්තෝබර් විප්ලවයේ අත්දැකීම් පියවරෙන් පියවරට අධ්‍යයනය කිරීම හා උකහා ගැනීම මුලු පක්ෂයට ම විශේෂයෙන් ම එහි තරුණ පරපුරට, නැතිව ම බැරිය. පසුගිය වසරේ ජර්මානු පාඩම බරපතල සිහි කැඳවීමක් පමණක් නොව දරුණු අනතුරු හැඟවීමක් ද වේ.

ඔක්තෝබර් විප්ලවයේ ගමන් මග පිළිබඳව අතිශයින් ම ගැඹුරු වැටහීමක් වුව ද අපේ ජර්මානු පක්ෂයේ ජයග්‍රහණය පිළිබඳ සහතිකයක් නොවන බව විරෝධතාවක් වශයෙන් කෙනෙකුට නිසැක වම ඉස්මතු කල හැකිය. එහෙත් මෙබඳු තොග ගනනේ කෙරෙන සාරභූත වශයෙන් අවරසික (පිලිස්තීනු) යුක්තිකරණයන් අපව අතරමං කරනු නිසැකය. හුදෙක් ඔක්තෝබර් විප්ලවය පිළිබඳ හැදෑරීම සෙසු රටවල් තුළ ජයග්‍රහනය සහතික කිරීමට නොසෑහෙන බව සත්තය. එහෙත් විප්ලවයේ නීති හා විධි ක්‍රම

පිළිබඳ වැටහීමක් මත පදනම් වූ දුරදක්නා අධිෂ්ඨාන සහගත පක්ෂ නායකත්වයක් නැතිව, විප්ලවයේ පූර්වාවශ්‍යතාවන් සියල්ල පවත්නා තත්වයන් පැන නැගිය හැකිය. පසු ගිය අවුරුද්දේ ජර්මනියේ උද්ගත වූ තත්ත්වය හරියටම මෙයයි. මෙබඳු තත්ත්වයන් වෙනත් රටවලත් යලි යලිත් ඇති විය හැකිය. එහෙත් කම්කරු පන්තික විප්ලවයේ නීති හා විධික්‍රම හැදෑරීමට, මේ දක්වා, අපගේ ඔක්තෝබර් අත්දැකීමට වඩා ප්‍රගාඨ වූ ද වැදගත් වූ ද මූළාශ්‍රයක් වෙන ඇත්තේ නැත. ඔක්තෝබරයේ ඉතිහාසය විමර්ශනාත්මක හා සමීපව සවිස්තර වූ අධ්‍යයනයක් මගින් උකහා ගැනීමට අසමත් වන යුරෝපීය කොමියුනිස්ට් පක්ෂවල නායකනයන්, සැසඳෙනු ඇත්තේ නූතන තත්ත්වයන් යටතේ අලුත් යුද්ධවලට සැරසීමේ දී පසු ගිය අධිරාජ්‍ය යුද්ධයේ මූලෝපායික, උපායික හා තාක්ෂණික අත්දැකීම් හැදෑරීමට අසමත් වන හමුදාපතියකුට ය. එබඳු හමුදාපතියෙක් තම හමුදාවන් අනාගතයේ දී නොවරදවා ම පරාජයට ඇද දමනු ඇත.

කම්කරු පන්ති විප්ලවයේ අතිමූලික උපකරණය වනාහි පක්ෂයයි. අපේ අත්දැකමේ පදනම උඩ 1917 පෙබරවාරි සිට 1918 පෙබරවාරි දක්වා තනි එක් අවුරුද්දක් ගත්තත් සහ පින්ලන්තයේ, හංගේරියාවේ, ඉතාලියේ, බල්ගේරියාවේ හා ජර්මනියේ අමතර අත්දැකීම්වල පදනම උඩ වෙනස් කළ නොහැකි න්‍යායක් තරමට ම අපට තහවුරු කළ හැකි රීතියක් තිබේ. එනම්, විප්ලවවාදී සූදානම ඇති කර ගැනීමේ ක්‍රියාකාරීත්වයේ සිට බලය සඳහා ක්ෂනික අරගලයට පරිවර්තනය වීමේ දී පක්ෂ අර්බුදයක් පැන නැගීම අනිවාර්ය යන්නයි. පොදුවේ කතා කරන කල් හි පක්ෂයේ ගමන් මගේ සෑම බරපතල සන්ධිස්ථානයක දී ම, අලුත් නැම්මට පූර්ව රංගයක් ලෙස හෝ එහි ප්‍රතිඵලයක් ලෙස හෝ පක්ෂය තුළ අර්බුද පැන නගී. මෙය පැහැදිලි කළ හැක්කේ පහත සඳහන් ආකාරයටය. පක්ෂයක වර්ධනයේ සෑම කාල පරිච්ඡේදයකදීම පක්ෂයකට තමන්ගේම තමන්ගේ ම විශේෂ ලක්ෂණ පවතින අතර එම සෑම කාල පරිච්ඡේදයකට ම සුවිශේෂ පුරුදු හා වැඩ විධි අවශ්‍යය. උපායික වෙනසක් මෙම පුරුදු හා වැඩ විධි වල වැඩි හෝ අඩු බිඳීමක් ඇති කරයි. අභ්‍යන්තර පක්ෂ ඝර්ෂණයේ හා අර්බුදවල ඉතා ම සමීප හා ඍජු මූලය පවත්නේ මෙහි ය. 1917 ජුලි මාසයේ දී ලෙනින් මෙසේ ලිවීය. "ඉතිහාසය හදිසි නැම්මක් ගන්නා කල්හි, ඉතාම දියුණු පක්ෂ පවා නව තත්ත්වයකට අනුව හැඩ ගැසීමට දීර්ඝ කාලීනව හෝ කෙටි කාලීනව අසමර්ථ වීම නිතර නිතරම සිදුවන දෙයකි. එබඳු පක්ෂ, ඊයේ සටන් පාඨ - ඊයේ නිවැරදි වුවද අද මුලුමනින් ම අර්ථ විරහතව ඇති සටන් පාඨ, ඉතිහාසය සිය හදිසි නැම්ම ගන්තේ යම් 'ක්ෂනික භාවයකින්' ද එම 'ක්ෂනික භාවයෙන්' ම සිය අර්ථය වියෝ කරගෙන ඇති සටන් පාඨ - යලි යලිත් වමාරමින් සිටිති" (එකතු කල කෘති, 14 වෙළුම, 2 කොටස, 12 පි) වෙනස බෙහෙවින් ආකාස්මික ද හදිසි ද වුව හොත්, කලින් කාල පරිච්ඡේදයේ දී පක්ෂයේ ප්‍රධාන අංශයන් තුළ උදාසීනතාවේ හා තත්වාරක්ෂකතාවේ අංග බෙහෙවින් ගොනුවී පැවතුනහොත්, වසර හෝ දශක ගනනාවක් තිස්සේ තමන් සූදානම් වෙමින් සිටි උත්තම හා තීරණාත්මක මොහොත එළඹී සිටි කල් හි පක්ෂය සිය නායක කර්තව්‍යය ඉටු කිරීමට අසමර්ථ වීමේ අන්තරාය පැන නගී. පක්ෂය අර්බුදයකින් දෙදරු වී යයි. ව්‍යාපාරය පක්ෂය පසුකර යමින් පරාජය කරා ඇද වැටෙයි.

විප්ලවවාදී පක්ෂයක් අනෙක් දේශපාලන බලවේගයන්ගේ පීඩනයට භාජනය වේ. තමන්ගේ වර්ධනයේ සෑම අවධියක දී ම පක්ෂය මෙම පීඩනය ප්‍රතිහරනය කිරීමේ ද පරාජය කිරීමේ ද තමන්ගේ ම විධික්‍රම විස්තාරනය කර ගනී. උපායික නැම්මක් ද ඉන් පැන නගින්නා වූ අභ්‍යන්තර යලි කාන්ඩ ගැසීම් හා ඝර්ෂන ද තුළ පක්ෂයේ ප්‍රතිවිරෝධක බලය දුබල වේ. උපායික හැරීමක අවශ්‍යතාවෙන් හට ගන්නා වූ පක්ෂයේ අභ්‍යන්තර කණ්ඩායම් තමන්ගේ ආරම්භක විවාදාත්මක ආස්ථානයන්ගෙන් බොහෝ ඈතට වර්ධනය වී විවිධ පන්ති ප්‍රවනතාවන්ගේ ආධාරක ලෙස සේවය කිරීම කරා වර්ධනය වීමේ හැකියාවක් මෙයින් නිරතුරුවම පැන නගී. අප මෙම ප්‍රශ්නය වඩාත් සරලව ඉදිරිපත් කරතොත් තමන්ගේ ම පන්තියේ ඓතිහාසික කර්තව්‍යයන්ට අනුව පා තබා නොයන පක්ෂය අනෙකුත් පන්තිවල වක්‍ර උපකරණයක් බවට පත්වේ, හෝ පත් වීමේ අවදානමට හසුවේ.

උපායන්ගේ සෑම බරපතල නැරම්මක් පිළිබඳව ම අප ඉහත සඳහන් කල දෙය සත්‍ය නම්, මූලෝපායේ මහා පරිවර්තන සම්බන්ධයෙන් එය වඩාත් සත්‍ය වේ. යුද්ධ ශාස්ත්‍රයේ සාදෘශ්‍යය යොදා ගත හොත් දේශපාලනයේ දී, අප උපායන් යයි නම් කරන දෙයින් අදහස් කෙරෙන්නේ තනි මෙහෙයුම් කිරීමේ කලාවයි. අප මූලෝපාය යනුවෙන් අදහස් කරන්නේ, අත්පත් කර ගැනීමේ එනම්, බලය අල්ලා ගැනීමේ කලා වයි. අපි පසුගිය ලෝක යුද්ධයට පෙර මෙම වෙනස රීතියක් වශයෙන්ම ග්‍රහනය කර නො ගත්තේමු. දෙවන ජාත්‍යන්තරයේ යුගයේ දී අප සීමා වූයේ තනිකර ම සමාජ ප්‍රජාතන්ත්‍රවාදී උපායන් පිළිබඳ සංකල්පයන්ට ය. මෙසේ වීම අහම්බයක් වූයේ ද නැත. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය පාර්ලිමේන්තු උපායන්, වෘත්තීය සමිති උපායන්, නගර සභා උපායන්, සමූපකාර උපායන් යනාදීය යොදා ගත්තේය. එහෙත් සතුරා පරාජය කිරීම සඳහා සියලු බලවේග හා සම්පත් සියලු වර්ගවල බලකායන් ඒකාබද්ධ කිරීම පිළිබඳ ප්‍රශ්නය ඇත්ත වශයෙන් ම දෙවන ජාත්‍යන්තරයේ කාල පරිච්ඡේදයේ දී කවර කලෙක වත් ඉස්මතු නොකරන ලදි; එසේ වූයේ බලය සඳහා අරගලය පිළිබඳ ප්‍රායෝගික කර්තව්‍ය එම කාල පරිච්ඡේදය තුළ ඉස්මතු නොවූ තාක් දුරට ය. දීර්ඝ ඉසුඹුවකට පසුව කම්කරු පන්ති අරගලයේ අති මූළික නැත හොත් මූලෝපායික ප්‍රශ්නයන් ප්‍රථම වතාවට ඉදිරිපත් කරන ලද්දේ 1905 විප්ලවය විසිනි. එම නිසා රුසියාවේ විප්ලවාදී සමාජ ප්‍රජාතාන්ත්‍රවාදීන්ට එනම් බොල්ශේවිකයන්ට අතිමහත් වාසියක් අත්පත් විය. මහා විප්ලවකාරී මූලෝපායයේ යුගය ප්‍රථමයෙන් 1917 දී රුසියාවට උදා වූ අතර අනතුරුව එය යුරෝපයේ ඉතිරි රටවලට ද ඇරඹුණි. මූලෝපාය සත්තකින් ම උපායන් නොතකා හරින්නේ නැත. වෘත්තීය සමිති ව්‍යාපාරය පිළිබඳ ප්‍රශ්න පාර්ලිමේන්තු වැඩ පිළිබඳ ප්‍රශ්න යනාදිය අතුරුදහන් වන්නේ නැත. ඒ වෙනුවට සිදුවන්නේ ඒවා බලය සඳහා ඒකාග්‍ර අරගලයට යටත් විධි ක්‍රම ලෙස අලුත් අර්ථයක් ගැබ්කර ගැනීම යි. උපායන් මූලෝපායට යටත් ය.

උපායික හැරීම් සාමාන්‍යයෙන් පක්ෂ තුළ අභ්‍යන්තර ඝර්ෂණයට තුඩු දේ නම් මූලෝපික නැම්වලින් පැන නගින ඝර්ෂනය ඊට වඩා කොතරම් ගැඹුරු හා භයංකර විය යුතු ද මේ සියලු නැම් අතරින් අතිශයින් ම ක්ෂනික වන්නේ කම්කරු පන්තික පක්ෂය සූදානමේ හා ප්‍රචාරයේ සංවිධානයේ හා උද්ඝෝෂණයේ කටයුතුවල සිට බලය සඳහා තත්ක්ෂනික අරගලය කරා, එනම්, ධනේෂ්වරයට එරෙහි

සන්නද්ධ නැගිටීමක් කරා හැරීමයි. පක්ෂය තුළ ඉතුරුපහදව පවත්නා වැනෙනසුලු, සංශවාදී, සම්මුතිවාදී, යටත් වන සුලු, කොටින් කීවොත් මෙන්ශෙවික්වාදී මේ සියල්ල සන්නද්ධ නැගිටීමට එරෙහිව ඉස්මත්තට එයි; ඔවුහු තම විරුද්ධත්වය යුක්ති යුක්ත කිරීම සඳහා න්‍යායික සූත්‍ර සොයා, ඒවා පෙර දිනයේ අවස්ථාවාදී සතුරන්ගේ අවි ගබඩාවේ කල් තබාම සකසා තිබී. සොයා ගනිති. අපට මෙම ප්‍රපංචය නිරීක්ෂණය කිරීමට අනාගතයේ බොහෝ අවස්ථාවලදී ඉඩ ලැබෙනු ඇත.

තීරනාත්මක අරගලයේ මුවවිට දී, පක්ෂ අවි අවසාන වශයෙන් සමාලෝචනය හා තෝරා ගැනීම සිදු වූයේ පෙබරවාරි සිට ඔක්තෝබර් දක්වා වූ කාල පරිච්ඡේදයේ දී මහජනතාව අතර හැකි තරම් පලල් උද්ඝෝෂනාත්මක හා සංවිධානාත්මක වැඩවල පදනම මත ය. ඔක්තෝබර් සමයේදී ද ඔක්තෝබරයෙන් පසුව ද මෙම අවි උරගා බලන ලද්දේ සද්දන්ත ඓතිහාසික ක්‍රියාවල ගින්න තුළය. ඔක්තෝබරයෙන් අවුරුදු කිහිපයකට පසු අද දින පොදුවේ විප්ලවය සම්බන්ධ ව ද විශේෂයෙන් රුසියානු විප්ලවය සම්බන්ධ ව ද විවිධ දෘෂ්ටි කෝනයෙන් පිළිබඳ තක්සේරුවක් කිරීමේ දී 1917 අත්දැකීම් මග හැරීම වනා හි වඳ පොතේගුරුවාදයේ නිමග්න වීමකි. එය සත්තකින් ම මාකාස්වාදී දේශපාලන විශ්ලේෂණයක් නම් නොවනු ඇත. එබන්දක් සම වනු ඇත්තේ පිහිනුම්කරුවන් විවිධ පිහිනුම් ක්‍රම ක්‍රියාවට දමන ගග දෙස බැලීම මුරන්ඩු ලෙස ප්‍රතික්ෂේප කරමින් එම විවිධ පිහිනුම් ක්‍රමවල වාසි අවාසි ක්‍රම ගැන දබර කර ගැනීමකටය. විප්ලවය පිළිබඳ විවිධ දෘෂ්ටි කොනයන් පිළිබඳව කෙරෙන හොඳම මිම්ම වනු ඇත්තේ ඒවා විල්පවය සමයේ දී ම වැඩකළේ කෙසේද යනු උරගා බැලීම ය; පිහිනීමේ ක්‍රමයක් හොඳින් උරගා බැලෙන්නේ පිහිනුම්කරුවකු වතුරට පැන්න විට දී මෙනි.

පරිවර්තනය ෘ විජේ ඩයස්